## රංගෙ බණ්ඩාරගේ නිදර්ශනය

පුත්තලම් දිස්ත්‍රික්කයෙන් තේරී පත්වූ රංගෙ බණ්ඩාර ගැන සිතා බලන්න. තමාට කැබිනට් අමාත්‍ය ධුරයක් නොලැබීම ගැන අපේක්ෂා භංගත්වයට පත්ව ඇති බවට චෝදනා කර ඇති ඔහු ඒ මානව හිමිකම් උල්ලංඝනය ගැන ඉදිරියේ දී තමන් යම් පියවරක් ගන්නා බව පසුගිය දා පැවති මාධ්‍ය සාකච්ඡාවකදී කියා ඇති බව මාධ්‍ය වාර්තා කෙළේය. ඔව්, අද කාලයේ මන්ත්‍රීවරයෙකුට ඇමතිවරයකු වීමම මූලික මිනිස් අයිතියක් භුක්ති විඳීමකි. මේ තත්වය යටතේ මානව හිමිකම් සහ මූලික අයිතීන් ගැන වෙනම ලැයිස්තුවක් ලිවීමට එක්සත් ජාතීන්ගේ සංවිධානයට සිදු වනු ඇත. සරදම වන්නේ, අනිත් පැත්තෙන්, නෛතික මුක්තියක් ඇති ජනාධිපතිවරයාට එරෙහිවත් නීතිපතිවරයා වගඋත්තරකරු කොට තමන්ගේ මූලික අයිතීන් උල්ලංඝණය කළ බවට මේ දේශපාලඥයන් නඩු පැවරීමයි. එය වෙනම ආකාරයක කතාවකි.

## බාබර් සාප්පුව

මහින්ද රාජපක්ෂ නිර්මාණය කළ වඩාත් ආකර්ශනීය සංකල්පයක් තිබේ. ඒ, බාබර් සාප්පුවක් ගැන කතාවකි. ඉස්සර බාබර් සාප්පුවල තිබුණේ, කෙනෙකුට ඇතුලු වීමට සේම පිටවීමටත් ඉතා පහසුවෙන් හැකි වන, දෙපැත්තට ඇරෙන සහ පැද්දෙන් දොර පලු දෙකකි. තමාගේ ආණ්ඩුවත් එවැනි දොරක් ඇති තැනක් බව මහින්ද රාජපක්ෂ කියා තිබේ. මැති ඇමතිවරුන්ට අවශ්‍ය නම් පිට වන්නටත්, ඇතුලු වන්නටත් අවසර තිබේ. ඔවුන් විපක්ෂයට යන්නේ නම් ඊට ද අවසර ඇත. ඔවුන් නැවත ආණ්ඩුවට එන්නේ නම් ඊටත් පහසුකම් සලසනු ලැබේ. එසේ එන විට අලුතින් ඇමතිකමක් දීමටත් පුළුවන.

කැබිනට් අමාත්‍ය සංඛ්‍යාවක සීමාව පිළිබඳ බාධාවක් මහින්දට එදා තිබුණේ නැත. එය පාවිච්චි කරමින් ඔහු නැටූ සෙල්ලම් අපි නොදන්නේ ද? එසේ ඇමතිකම් දීමේදී යම් තාර්කිකත්වයක් පිළිබඳ හැඟීමක් ඔහුගේ අහලකවත් තිබුණේ නැත. ඒ හේතුවෙන් සිදු වන ජනතා මුදල් නාස්තිය ඔහුට ප්‍රශ්නයක් වුණේ නැත. පියවා ගත නොහැකි අයවැය හිඟයක් පැවතීම ඔහුට ප්‍රශ්නයක් වුණේ නැත. ඔහුගේ රාජ්‍ය කාලයේදී, ඇමතිකමක් නැති මන්ත්‍රීවරයෙකු සොයා ගැනීමටත් නොහැකි වූ තරම් ය.

## නොමිලේ ලැබෙන බදු රහිත වාහන බලපත්‍ර

වාහන බලපත්‍ර සෙල්ලම විගඩමක් බවට පත්වුණේ ඒ තතු යටතේ ය. මන්ත්‍රීවරයෙකුට ඇමතිකමක් ලැබෙන විටත් වාහන බලපත්‍රයක් ලැබෙන්නේය. එපමණක් ද නොවේ. ඒ සඳහා වන ඉන්ධනත් නොමිලේ ලැබෙන්නේය. තමන් කැමති තැනක යන්නට එන්නට ඔවුන්ට පුළුවන. තමන්ගේ අතින් කරන්ට සිදුවන කිසි වියදමක් නැත. කැබිනට් අමාත්‍ය ධුරයත්, ඒ සමග ලැබෙන යානවාහන ඇතුළු අනෙකුත් පරිවාර පහසුකමුත් සමග සමාජ තත්වය ඉඳුරා ගැට ගැසුණි. ඒ සියල්ලට උඩින් පිටරට සවාරි ලැබෙන විට තත්වය තවත් නගින්නේය.

## කෑලිවලට කැඩී යාමේ සහ කල්ලි ගැසීමේ අවදානම

පිස්සු ජනාධිපතිවරයෙකුගේ උමතු කල්ක්‍රියාවට මුහුණදීමට අමතරව මෙවැනි දේශපාලඥයන්ගේ තත්ව අභියෝගයට මුහුණදීමටත් අගමැතිවරයාට සිදුව තිබීම ගැන මට ඇත්තේ අනුකම්පාවකි. යහපාලන ප්‍රතිපත්ති යටතේ ඇති කර ගත් ඇමති මණ්ඩලයේ සීමාව 30 කි. එසේ වන කල, තමන්ගේ මන්ත්‍රීවරුන් සියල්ලන් කෙසේ නම් ඔහු තෘප්තිමත්ව තබා ගන්නද? ඒ තත්වය යටතේ, මන්ත්‍රී වරුන් කැඞූ යාම හෝ කල්ලි ගැසීම කෙසේ නම් විසඳා ගන්නද?

මේ අතර, ආණ්ඩුව ඇතුළේ සිටින යම් කොටසක් බල තැරුව්කාරයෙකු යටතේ කල්ලි ගැසෙමින් සිටිති. උන්නතිකාමයෙන් පෙළෙන යම් මන්ත්‍රීවරයෙකු හෝ ඇමතිවරයෙකු වෙනම කණ්ඩායමක් ගොඩනගමින් සිටින බව කියැවේ. එහි අරමුණ වන්නේ, එක්සත් ජාතික පක්ෂය තුළ වෙනම බල කේන්ද්‍රයක් ගොඩනගා ගැනීමයි.

එවැනි තත්වයක් තුළ අනාගතයේ ජනාධිපති අපේක්ෂකයෙකු හෝ අගමැති අපේක්ෂකයෙකු තෝරා ගැනීම පිළිබඳ සැබෑ ගැටළුවක් තිබේ. ඒ නිසා, පක්ෂයේ නායකත්වය සහ ඉහළ ධූරාවලියේ ක්‍රියකාරීන් ඒ අවදානම ගැන සැලකිලිමත් විය යුතුය.

මේ සියලු කරුණුවලින් පෙනී යන්නේ අපේ ව්‍යවස්ථාවේ බරපතල වෙනසක් සිදුකළ යුතුව ඇති බවයි. එය ශ්‍රී ලංකාවේ ඉදිරි පැවැත්ම සඳහා අත්‍යාවශ්‍ය වන්නේය. එහෙත් එය කරන්නේ කෙසේද? ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡුන්දයක් අවශ්‍ය කෙරේ. ඒ නිසා, අනාගතයේ මෙවැනි අවාසනාවන්ත තත්වයන් ඇති නොවීම සඳහා මේ අවස්ථාවේ ද්වි පාර්ශ්වීය එකඟත්වයන් ඇති කර ගත යුතුව තිබේ.

සිංහල පරිවර්තනය යහපාලනය ලංකා

# සමුගන්න අවසරයි

දශක දෙකකට ආසන්න කාලයක් මම ඕස්ට්‍රේලියාවේ සිංහල පත්තර වෙනුවෙන් කැප කළෙමි. මේ කාලය බොහෝ දුක් ගැහැට මැදින් ගෙවුණු කාලයක් වුවද ආපසු හැරී බලන විට එහි යම් සුන්දරත්වයක්ද නැත්තේ යයි මට නොසිතෙයි.

සෙරෙන්ඩිබ් නිව්ස් පුවත්පතේ සිංහල පිටු සංස්කරණය කරමින් ඇරඹුන මේ ගමනේ සන්ධිස්ථාන අපමණය. පහන පුවත්පත ආරම්භ කිරීමට දායක වීමත් එහි සම සංස්කාරකවරයා වීමත් සන්නසේ සංස්කාරකවරයා ලෙසත් සංස්කරණ උපදේශක ලෙසත් නැවත සම සංස්කාරක ලෙසත් වසර දහතුනක් කටයුතු කිරීමත් කැපී පෙනෙයි.

මේ කටුක ගමනේ මට කැප කරන්නට සිදුවූ දෑ බොහෝ ය. කකුලෙන් ඇද වට්ටන්නට තැත්කළවුන් කරනවුන් අතලොස්සක් සිටි බවද ඇත්ත ය. ඒ කිසිවක් ගැන නොලියමි. නොසිතමි. නොතකමි. එහෙත් අපට හමුවූ බහුතරයක් වූ සුන්දර මිනිසුන් පිලිබඳ මතකය පමණක් රැගෙන යමි. අපට ආදරය කළ අප දිරිමත් කළ අප ඉදිරියට ගෙන ගිය ඒ හිතවතුන් සහ හිතවතියන් පිලිබඳ මතකය සදා අපේ සිතේ රැඳෙනු ඇත. ඒ අප්‍රමාණ වූ සෙනෙහස ඉතා සුන්දර ය. මා රැගෙන යන්නේ ඒ සුන්දර මතකය පමණකි.

මම ඕස්ට්‍රේලියාවේ සිංහල පුවත්පත් හරහා මට හැකි පමණින් මේ සමාජයට යමක් කළෙමි. ඒ වෙනුවෙන් ඔබේ හොඳ හිත හැරෙන්නට මා ලබාගත් හෝ උපයාගත් හෝ යමක් නැත.

මේ මා සංස්කරණය කරන අවසන් සන්නස කලාපයයි. මේ ඕස්ට්‍රේලියාවේ පුවත්පතක සංස්කරණයට මා දායක වන අවසන් අවස්ථාවයි. මේ නැවතුම් ලකුණ තබන අවස්ථාවයි.

මේ ගමන පිලිබඳව පොත් ගණනක් ලියන්නට අත්දැකීම් මට ලැබී ඇත. එහෙත් දශක දෙකක පමණ කාලයක් මා සමග රැඳුණු ඔබ සැමට ආදරය කරන බව පමණක් පවසමින් සමුගන්න ඉඩ දෙන්න.

ජගත් ජේ එදිරිසිංහ

